සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 09 - 2023

## ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දේව මැවිල්ලේ උසස් ම නිර්මාණය වන්නේ කුමක් ද?
    (i) සතුන් ය. (ii) ගස් ය.
    (iii) මිනිසා ය. (iv) ජලය ය.

02. නැවක් සෑදීම සඳහා දේව අණක් ලැබුණේ කාට ද?
    (i) නෝවාට ය. (ii) ආබ්‍රහම්ට යි.
    (iii) ඊසාක්ට යි. (iv) ආදම්ටයි.

03. ඉශ්‍රායෙලයේ ප්‍රථම රජු කවුරුන් ද?
    (i) සාමුවෙල් ය. (ii) සාවුල් ය.
    (iii) දාවිත් ය. (iv) ජොනතන් ය.

04. ජේසුස් වහන්සේ තම ප්‍රථම ප්‍රාතිහාර්ය සිදු කිරීමට තෝරා ගන්නා ලද නගරය කුමක් ද?
    (i) ගෙනෙසෙරතයයි. (ii) නාසරෙත් නුවරයි.
    (iii) දමස්කය යි. (iv) කානා නුවරයි.

05. හාරදහසකට කෑම දීම ප්‍රාතිහාර්යයේ දී ජේසුස් වහන්සේ රොටී කීයක් ගනු ලැබුවේ ද?
    (i) රොටී 7 කි. (ii) රොටී 6 කි.
    (iii) රොටී 5 කි. (iv) රොටී 4 කි.

06. ජේසුස් වහන්සේ අතක් පණ නැති මිනිසාට සුවය ලබා දුන්නේ කවදා ද?
    (i) පෙන්තකොස්ත දින දී ය. (ii) සබත් දින දී ය.
    (iii) මහා සිකුරාදා දින දී ය. (iv) මහා බ්‍රහස්පතින්දා දින දී ය.

07. ප්‍රේරිතයන් හට ශුද්ධාත්ම බලය ලැබුණේ කවදා ද?
    (i) පෙන්තකොස්ත දින දී ය. (ii) පාස්කු ඉරු දින දී ය.
    (iii) ස්වර්ගාරෝහණ දින දී ය. (iv) සබත් දින දී ය.

08. මෙපිබෝෂෙත්ගේ පියා කවුරුන් ද?
    (i) සාවුල් ය. (ii) ජොනතන් ය.
    (iii) දාවිත් ය. (iv) ආබ්‍රහම් ය.

09. දොර්කස් ව මළවුන්ගෙන් නැගිටවනු ලැබුවේ කවුරුන් විසින් ද?
    (i) දාවිත් විසින් ය. (ii) සාවුල් විසින් ය.
    (iii) ජේසුස් වහන්සේ විසින් ය. (iv) පේදුරු විසින් ය.

10. උපස්ථායකයින් අතර ප්‍රධානියා වූයේ කවුරුන් ද?
   (i) සාවුල් ය. (ii) පිලිප් ය.
   (iii) ස්තේපන් ය. (iv) සාමුවෙල් ය.

11. ශුද්ධ වූ සභාව විසින් උපස්ථායකයින් කී දෙනෙකු තෝරා පත් කර ගත්තේ ද?
   (i) 6 දෙනෙකි. (ii) 7 දෙනෙකි.
   (iii) 8 දෙනෙකි. (iv) 9 දෙනෙකි.

12. කිතුණු දිවියේ වැදගත් ම සන්නිවේදන මාධ්‍යය වන්නේ කුමක් ද?
   (i) යාච්ඤාව යි. (ii) ගීතිකාව යි.
   (iii) දිව්‍ය පූජාව යි. (iv) දේව වචනය යි.

13. කානා නුවර ගැන සඳහන් කරන එක ම සුබාරංචිය වන්නේ කුමක් ද?
   (i) මතෙව් සුබාරංචිය යි. (ii) මාක් සුබාරංචිය යි.
   (iii) ලූක් සුබාරංචිය යි. (iv) ජොහාන් සුබාරංචිය යි.

14. දොර්කස් ජීවත් වූ ගම කුමක් ද?
   (i) කපර්ණමුවේ ය. (ii) ජොප්පාවේ ය.
   (iii) පලස්තීනයේ ය. (iv) කනා නුවර ය.

15. මුල් කිතුණු සභාවේ ආරම්භය සිදු වූයේ කොහේ ද?
   (i) සිරියාවේ ය. (ii) අසිරියාවේ ය.
   (iii) පලස්තීනයේ ය. (iv) බැබිලෝනියාවේ ය.

16. ස්තේපන්ට ගල් ගැසූ තරුණයන්ගේ ඇඳුම් රැක බලා ගත්තේ කවු ද?
   (i) ජොනතන් ය. (ii) දාවිත් ය.
   (iii) ජොහාන් ය. (iv) සාවුල් (පාවුල්) ය.

17. දොර්කස් සඳහා භාවිතා කළ වෙනත් නමකි. මේ අතරින් කුමක් ද?
   (i) මරියා ය. (ii) ජෝවන්නා ය.
   (iii) තබීතා ය. (iv) සුසානා ය.

18. පාවුල් (සාවුල්) තුමාගේ සිත් හැරීම සිදුවන්නේ කොහේ දී ද?
   (i) දමස්කයට යන අතරතුර දී ය. (ii) ගලීලයට යන අතරතුර දී ය.
   (iii) ජෙරිකෝවට යන අතරතුර දී ය. (iv) කානා නුවරට යන අතරතුර දී ය.

19. ජේසුස් වහන්සේ රාජ්‍යය නිලධාරියාගේ පුත්‍රයා ට සුවය ලබා දුන්නේ කොහේ දී ද?
   (i) කපර්ණමුවේ දී ය. (ii) කානා නුවර දී ය.
   (iii) දමස්කයේ දී ය. (iv) ජෝර්දානයේ දීය.

20. ශුද්ධාත්ම බලය ලැබූ ප්‍රේරිතයන් කළ පළමු බලවත් ක්‍රියාව කුමක් ද?
   (i) දොර්කස් ව මරණින් නැගිටුවීම යි.
   (ii) අන්‍ය භාෂාවෙන් කතා කිරීම යි.
   (iii) අන් අයට යාච්ඤා කිරීම යි.
   (iv) ''සුදර්ශන'' දොරටුව අසළ සිටි කොර වූ මිනිසාව සුව කිරීමයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.

i. දාවිත් රජුගේ දිවියේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ වන අවස්ථා 2 ක් ලියන්න.

ii. නෝවාගේ පුතුන් දෙදෙනෙකු නම් කරන්න.

iii. ජේසුස් වහන්සේ විසින් සුවය ලබා දුන් රෝගීන් දෙදෙනෙකු නම් කරන්න.

iv. ජේසුස් වහන්සේ ධර්ම ශාලාවට පැමිණි කල සෙනග උන්වහන්සේ දෙස විමසිලිමත් ව බලා සිටියේ මන් ද?

v. තාක්ෂණයේ දියුණුවත් සමඟ වර්තමානයේ පවතින සන්නිවේදන මාධ්‍ය 2 ක් ලියන්න.

vi. ''අබ්බා'' යන අරමීය යෙදුමේ අර්ථය ලියන්න.

vii. ''ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව'' කියන අවස්ථා 2 ක් ලියන්න.

viii. දෙවියන් වහන්සේ අපගේ දිව්‍ය පෝෂකයාණන් බව ප්‍රකාශ කරන පැරණි ගිවිසුමේ සඳහන් උදාහරණ 02 ක් ලියන්න.

(ල. 2x8 = 16)

02. i. දෙවියන් වහන්සේ මිනිසාව නිර්මාණය කරන්නේ කෙසේ ද?

ii. නෝවා පිළිබඳ දේව වචනයේ සඳහන් කරුණු 03 ක් ලියන්න.

iii. කිතුනු දරුවෙකු ලෙස දේව කරුණාව ලැබීමට නම් ඔබේ ජීවිතයේ ප්‍රගුණ කළ යුතු යහ ගුණාංග 06 ක් ලියන්න. (ල. 2+3+6 = 11)

03. i. යාච්ඤාව යනු කුමක්දැයි හඳුන්වන්න.

ii. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 03 ක් ලියන්න.

iii. ඔබේ අනාගත ජීවිතය ජය ගැනීමට අවශ්‍ය වරම් ඉල්ලා දෙව් පියාට සිදු කරන යාච්ඤාවක් ලියන්න.

(ල. 2+3+6 = 11)

04. i. බීමත්කම නිසා ඇති වන අයහපත් ප්‍රතිඵල 02 ක් ලියන්න.

ii. මාංසික තෘෂ්ණාවලට උදාහරණ 03 ක් ලියන්න.

iii. නව තාක්ෂණික දියුණුව දේව සේවය සඳහා භාවිතා කළ හැකි අවස්ථා 03 ක් ලියා කෙටි විස්තරයක් කරන්න. (ල. 2+3+6 = 11)

05. i. කිතුණු සභාව වෙනුවෙන් පළමුවෙන් ම තම ජීවිතය පූජා කළ වේද සාක්ෂිකයා නම් කරන්න.

ii. මුල් කිතුණු සභාව මුහුණ දුන් පීඩාවන් 03 ක් ලියන්න.

iii. ඔබේ ජීවිතයට එන අභියෝග වලට සාර්ථකව මුහුණ දීම සඳහා ඔබට දේව දරුවෙකු ලෙස කළ හැකි කාර්යයන් 03 ක් පැහැදිලි කරන්න.

(ල. 2+3+6 = 11)

06. i. ජේසුස් වහන්සේගේ මරණින් දින 03 කට සහ දින 40 කට පසුව සිදු වූ විශේෂ සිදුවීම් දෙක ලියන්න.

ii. ශුද්ධාත්ම දානය ලැබූ ප්‍රේරිතවරු ක්‍රියා කළ ආකාර 03 ක් ලියන්න.

iii. සුබාරංචිය සමාජයට රැගෙන යාමට ඔබට කළ හැකි ක්‍රියාවන් 03 ක් ලියන්න.

(ල. 2+3+6 = 11)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## ක්‍රිස්තියානි ධර්මය

පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (iii) | 06. | (ii) | 11. | (ii) | 16. | (iv) |
| 02. | (i) | 07. | (i) | 12. | (i) | 17. | (iii) |
| 03. | (ii) | 08. | (ii) | 13. | (iv) | 18. | (i) |
| 04. | (iv) | 09. | (iv) | 14. | (ii) | 19. | (ii) |
| 05. | (i) | 10. | (iii) | 15. | (iii) | 20. | (iv) |

(ලකුණු 2x20=40)

---

II කොටස

01. i. • එන්ගෙදියේ දී සාවුල්ගේ ජීවිතය මිදීම.
• මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වීම.

ii. ෂෙම්, හාම්, ජපෙත්

iii. අතක් පණ නැති මිනිසා, රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා, ලාදුරු රෝගීන්, අංශභාග රෝගීන් ආදී සිසුවා ලියා ඇති පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න.

iv. • උන්වහන්සේට වරද තබන පිණිස.
• සබත් දිනයේ දී උන්වහන්සේ අතක් පණ නැති මිනිසා සුව කරන්නේ දැයි බැලීමට.

v. අන්තර්ජාලය, ජංගම දුරකතන, රූපවාහිනිය ආදී ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

vi. ''පියාණනි''

vii. උදෑසන, රාත්‍රී යාච්ඤා කිරීමේ දී, දිව්‍ය පූජාවේ දී වැනි නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

viii. පාළුකරයේ දී ඉශ්‍රායෙල් ජනයාට පෝෂණය ලබා දීම, එලියා දිවැසිවරයා ශාරපෙත් හි වැන්දඹු ස්ත්‍රිය මඟින් හා කපුටන් මඟින් පෝෂණය කිරීම.

(ලකුණු 2x8=16)

02. i. පොළවේ දූවිල්ලෙන් තම ස්වරූපයට අනුව

ii. ♦ සත් ගුණවත් මිනිසෙකු ලෙස හැඳින්වීම.

♦ පරම්පරාවෙන් නිදොස් මිනිසා ලෙස හැඳින්වීම.

♦ දෙවියන් වහන්සේ සමඟ සුහදතාවයෙන් හැසිරුණේය.

♦ දෙවියන් වහන්සේ අබිමුවේ කරුණාව ලැබීම.

iii. සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6=11)

03. i. කිතුනු දිවියේ වැදගත්ම සන්නිවේදන මාධ්‍යයයි.

ii. ♦ තම ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙර.

♦ ප්‍රාතිහාර්ය සිදු කිරීමට පෙර.

♦ සිය මෙහෙය ඇරඹීමට පෙර.

♦ දුක් ප්‍රාප්තියට පෙර.

iii. සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6=11)

04. i. කලහකාරී ලෙස හැසිරීම, මුදල් නාස්ති වීම, පවුල් ආරවුල්, දේව ස්වභාවය විනාශ වීම ආදී පිළිතුරු.

ii. බීමත්කම, අපවිත්‍රකම, වෛරය, කාමමිථ්‍යාචාරය, ආරවුල්, පක්ෂභේද, යසස්කාමය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, සතුරු කම, කොඩිවින ආදිය...

iii. සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6=11)

05. i. ශුද්ධ වූ ස්තේපන් තුමා.

ii. කිතුනුවන් ජුදා ව්‍යවස්ථාවට අපහාස කරන්නන් ලෙස සැලකීම, අසාධාරණ අයුරින් නඩු තීන්දු ලබා දීම, ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් සාක්ෂි දැරීම තහනම් වීම ආදී පිළිතුරු

iii. සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6=11)

06. i. දින 03 = නැවත උත්ථාන වීම.

දින 40 = ස්වර්ගාරෝහණය වීම.

ii. උත්ථානය පිළිබඳ සාක්ෂි දැරීම, දේශනා කිරීම, බෞතිස්මය ලබා දීම, ලෙඩුන් සුවපත් කිරීම.

iii. සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6=11)